# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.03 පැය 2300 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1330/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විදේශ ගතව සිටි අවශ්‍ය කරන සැකකරුවන් තිදෙනෙකු දිවයිනට රැගෙන ඒම - පොලිස් මූලස්ථානය.**

විදේශ ගතව සිටි මහා පරිමාණ මුදල් වංචාවන් වලට අවශ්‍ය කර සිටි ඉන්දියාවෙන් පිටුවහල් කරන ලද සැකකරුවන් තිදෙනෙකු 2025.07.03 වන අද දින සවස් කාලයේ කටුනායක ගුවන් තොටුපලේදී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**රැගෙන එන ලද සැකකරුවන් සම්බන්ධව හා ඔවුන්ට එරෙහිව ඇති අපරාධ සම්බන්ධ විස්තර :-**

**01** නම - මාදිවෙලගේ අසිත සාගර තුණතිලක
වයස - අවුරුදු 33
ලිපිනය - අංක 365, දකුණු වැලිහේන, කොච්චිකඩේ

**02** නම - සිල්පත්වාරිගේ සුමිත් රෝලන් ප්‍රනාන්දු
වයස - අවුරුදු 44
ලිපිනය - අංක 401 දකුණු වැලිහේන, කොච්චිකඩේ

- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් කොටි 02 ක දුම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී වංචා කිරීම.
- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 42 ක දුම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී වංචා කිරීම.
- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 44 ක දුම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.
- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 27 ක දුම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.

- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 80 ක දූම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.

- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 40 ක දුම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.

- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 35 ක දූම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.

- පුත්තලම ගරු මහෙස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවට අදාලව රුපියල් ලක්ෂ 80 ක දූම්කොල ලබා ගෙන චෙක්පත් ලබාදී අගරු වීමට සලස්වා වංචා කිරීම.

ඉහත සැකකරුවන් දෙදෙනා වැඩිදුර විමර්ශන සඳහා පුත්තලම විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත බාර දීමට නියමිතය.

**03 නම - සෙල්වරාජ් කබිලන්**
**වයස - අවුරුදු 34**
**ලිපිනය - උදයල්කට්ටු උතුර, වැල්ලප්පලම්, පුදුකුඩිඉරිප්පු**

- මෙම සැකකරු 2023.08.31 වන දින මුලතිව් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොඩිකාමම් පොලිස් වසමේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 240 ක් සන්තකයේ තබාගැනීම හා ප්‍රවාහනය කිරීමේ වරදට චාවකච්චේරිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවකට අවශ්‍ය කරන සැකකරුවෙකි.

මෙම සැකකරු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**